# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2448/14 - 2025 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා - 2025.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/5/2019/HA /556.
*මගේ අංකය* : BER/4/5/2/79.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 736 පිණිදියමුල්ල ග්‍රාම නිලධාරි වසමේ, වඩුගොඩ ගමේ, පොතුපිටියවත්ත ඉඩමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 530680, කලාප අංක 04, පත්‍ර අංක 01 හා 2024.12.24 දිනැති පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0194ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

01. කැබලි අංක 01

ඉඩමේ නම: පොතුපිටියවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ බුදු මැදුරක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: පර්චස් 7.7

*උතුරට*: මූ.පි.ක. 377හි කැබලි අංක 1; *නැගෙනහිරට*: මූ.පි.ක. 377 හි කැබලි අංක 1; *දකුණට*: මූ.පි.ක. 377හි කැබලි අංක 1 (මාර්ගය) සහ ඒ. එන්. පෙරේරා සහ තවත් අය භුක්ති විඳින බේරුවලගේවත්ත; *බටහිරට*: ඒ. එන්. පෙරේරා සහ තවත් අය භුක්ති විඳින බේරුවලගේවත්ත සහ මූ. පි. ක. 377 හි කැබලි අංක 1

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 අගෝස්තු 27** වැනි දින **පෙ.ව. 10.00**ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 අගෝස්තු 20 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම / පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ

හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එල්. යූ. ජානක පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2025 ජූලි මස 21 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0051

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/11/2018/H /500.
*මගේ අංකය* : BER/4/5/2/80.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 736 පිණිදියමුල්ල ග්‍රාම නිලධාරි වසමේ, වඩුගොඩ ගමේ, ඉඩමේ නම නොදන්නා සහ පොතුපිටියවත්ත නම් ඉඩමෙහි පිහිටි කැඩැස්තර සිතියම් අංක 530680, කලාප අංක 04, පත්‍ර අංක 02 හා 2024.12.26 දිනැති පිඹුරේ කැබලි අංක 01 සහ 02 ලෙස පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0115ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැලි :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: නොදනී; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු; ප්‍රමාණය: පර්චස් 0.5

*උතුරට*: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත සහ එස්. ඩී. ජයනෙත්ති විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත සහ මාර්ගය; *නැගෙනහිරට*: මාර්ගය, මූ. පි. ක. 377හි කැබලි අංක 1 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 2 සහ මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත; *බටහිරට*: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: පොතුපිටියවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු; ප්‍රමාණය: පර්චස් 4.1

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 1, මාර්ගය සහ මූ. පි. ක. 377හි කැබලි අංක 1; *නැගෙනහිරට*: මූ. පි. ක. 377හි කැබලි අංක 1 සහ ඒ. එන්. පෙරේරා සහ තවත් අය විසින් හිමිකම් කියන බේරුවලගේවත්ත; *දකුණට*: ඒ. එන්. පෙරේරා සහ තවත් අය විසින් හිමිකම් කියන බේරුවලගේවත්ත සහ මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත; *බටහිරට*: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන පොතුපිටියවත්ත සහ කැබලි අංක 01

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 අගෝස්තු 27** වැනි දින **පෙ.ව. 10.00**ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 අගෝස්තු 20 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම / පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එල්. යූ. ජානක පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2025 ජූලි මස 29 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0052

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.